# අහංකාර තිළිණිය



**K.M. හෙසන්යා හරසරණි**

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වා දන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක් වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලයේ ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය- මහනුවර

2023.11.01



එකමත් එක කාලෙක අසල්වැසි නිවෙස් දෙකක ළමයි දෙන්නෙක් හිටියා. එක්කෙනෙක් සයුරි. අනෙක් එක්කෙනා තිළිණි. මේ දෙන්නාගේම පාසල පිහිටා තිබුණේ නගරයේ. ඒ වගේම තමයි ඔවුන් දෙදෙනාම පාසල් ගියෙත් ආවෙත් එකම පාසල් බස් රථයෙන්.



සයුරි ආචාරශීලි වගේම නිහතමානී ළමයෙක්. ඇය සියලු ළමයින් සමග සහයෝගයෙන් කටයුතු කළා.

ඒ වුණාට තිළිණි නම් නිහතමානී වුණේ නැහැ. මොකද එයා අනෙක් සියලුම ළමයින්ට වඩා ලස්සන නිසා. ඇය නිතරම සිතුවේ ඇයගේ පෙනුම ගැන විතරයි. එයා ගොඩක් ආඩම්බර වුණේ එයා සයුරිට වඩා ලස්සන වුණු එක ගැන සහ දිග කොණ්ඩයක් තිබුණු එක ගැන. තිළිණි පාසලේදී හා බස් රථයේදී සයුරි සමග වැඩි කතාබහට ගියේ නැහැ. සැම විටම ඇය සයුරිව මග හැරීමට උත්සාහ කළා.



"තිළිණි ඔයත් එන්න අපිත් එක්ක සෙල්ලම් කරන්න" කියලා දවසක් සයුරි සහ ඇගේ මිතුරියන් තිළිනිට කතා කළා.

"ඔයාලා විහිලු කරනවද? සෙල්ලම් කරන්න ඇවිත් මම නම් මගේ ලස්සන මූණවත්, අත්වත් කිළිටු කරගන්නේ නැහැ" කියලා තිළිණි කිව්වා.

"හරි එහෙනම් ඔයා ඉන්න. අපි යනවා සෙල්ලම් කරන්න". සයුරියි එයාගේ මිතුරියනුයි සෙල්ලම් කරන්න ක්‍රීඩා පිට්ටනියට ගියා.

පාසල අවසන් වූ පසු පාසල් බස් රථයේදී සිසුන් අද දවසේ පන්තියේ සිදු වූ සිදුවීම් ගැන කතාබහක යෙදිලයි හිටියේ.

“ඒයි ඔයාලගේ ඔය කතාව මට හරිම කරදරයක්. පොඩ්ඩක් කට වහගෙන යන්නකෝ” තිළිණි කේන්තියෙන් කිව්වා.

“අනේ අපට සමාවෙන්න. අපේ කතාබහ ඔයාට කරදරයක් වුණාට” සයුරි කිව්වා. ඒ වගේම තමයි තිළිණි එයාගේ කොන්ඩේ ගැන ගොඩක් ආඩම්බරයෙන් හිතුවා. පාසල් බස් රථයේ ජනේලය අරිනවාටත් තිළිණි කැමති නැහැ.

“ඔය ජනේලය වහන්න. ඔයාලා ඔහොම කරන්නේ මගේ කොන්ඩේ අවුල් කරලා දාන්න නේද?”

“අයියෝ නෑ තිළිණි. අපිට රස්නේ නිසයි ජනේලය ඇරියේ ”. සයුරි දුකින් කිව්වා.

ඉතිං ඔහොම කාලයක් ගත වුණා. එක දවසක් තිළිණි පාසල් බස් රථයට නගින්න ගේට්ටුව ළඟ හිටියා. එදා හොඳටම වැස්ස දවසක්. බස් එකට තිළිණි නගින්නේ අන්තිමටම. මොකද අනික් ළමයින්ගේ ඇඟේ ගෑවෙන්නවත් තිළිණි කැමති නැති නිසා.


මෙහෙම නගිද්දී තිළිණි ලිස්සලා ගිහින් බිමට වැටුණා. තිළිණිගේ ඇඟ පුරාම මඩ. ඒ වගේම වැටුණපාරට එයාගේ ඇත හොඳටම තුවාල වෙලා ලේ ගලනවා. බස් එකේ ළමයි හැමෝම බස් එකෙන් බැහැලා ආවා. ඩ්‍රයිවර් මාමා තිළිනිව උස්සලා බස් එකට අරන් රෝහලට අරගෙන ගියා.




සයුරි ළමයි හැමෝම එක්ක එකතු වෙලා තිළිණිගේ ඇඟේ තිබුණු මඩ පිස දමා කොන්ඩේ තිබුණු වතුරත් ලේන්සුවකින් පිස දැමුවා.

රෝහලේදීත් සයුරි තිළිණි ළඟින්ම හිටියා.

“තිළිණි ඔයා අඩන්න එපා. අපි ඔයාගේ ළඟින් ඉන්නවනේ”. සයුරි කිව්වා.



තුවාලවලට බෙහෙත් දාලා තිළිණි ගෙදරට ඇරලුවා.ඒත් තිලිණිට සති දෙකක් විතර පාසල් එන්න ලැබුණේ නැහැ. එයාගේ තුවාල හොඳ වෙනකන්. ඒ කාලය පුරාම පාසල් වැඩ හැමදේම ලියලා දුන්නේ සයුරියි එයාගේ යාලුවෝයි. මොකද අතේ තුවාල නිසා තිලිණිට ලියන්න පුළුවන් වුණේ නැහැ.



**සති දෙකකට පසු................................**



තිළිණිට හොඳ වෙලා පාසලට ආවා.

“ඔයාලා මට කළේ කියන්න බැරි තරම් ලොකු උදව්වක්. මම මෙච්චර කාලයක් හිතුවේ නැහැ හැමෝම එක්ක සහයෝගයෙන් ඉන්න එක මේ තරම් වටිනවා කියලා. මගෙන් ඔයාලට වුණ වැරදිවලට සමාවෙන්න. මම අද ඉඳලා ඔයාලා හැමෝගෙම හොඳම යාලුවා වෙනවා” තිළිණි කිව්වා.

“අපි හැමෝම එකිනෙකාට උදව් කරන්න ඕනේ. සහයෝගයෙන් හිටියොත් මොන කරදර ආවත් අපි තනිවෙන්නේ නැහැ’’. සයුරි කිව්වා.

ඊට පස්සේ තිළිණියි, සයුරියි එයාලගේ යාළුවොයි හරිම සතුටින්, සහයෝගයෙන් හිටියා.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හ බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශ්වයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01